ධම්මික විජේසිංහ
සුබෝධා ජ්‍යොතිශ සේවය - මෙල්බර්න්




පසුගිය කලාපයට මා ලියූ "ප්‍රේම විවාහ, යෝජිත විවාහ හා විවාහ දෝෂ" යන ලිපියට පාඨක ප්‍රතිචාර බෙහෙවින් ලැබුණි. එබැවින්, එම මාතෘකාවට කාලීනව ඇති වැදගත්කම ගැන සලකා එයටම අදාල තවත් වැදගත් තොරතුරු මෙවර කලාපයෙන් ද ඉදිරිපත් කරමි.

නවග්‍රහයින්ද යුරේනස්, නැප්චූන් හා ප්ලූටෝද ගත් කල නෛසර්ගික ගුණ වශයෙන් ශුභ අශුභ වශයෙන් කොටස් 2 ක බෙදිය හැක. ඒ අනුව රවි, කුජ, ශනි, යුරේනස්, ප්ලූටෝ, රාහු, හා කේතු ග්‍රහයින් අශුභයින් ලෙසත් සඳු, බුධ, ගුරු, සිකුරු, නැප්චූන් යන ග්‍රහයින් ශුභයින් ලෙසත් සැලකේ. මෙය මූලික පිලිගැනීමයි.



නමුත් බුධ, කේතු වැනි ඇතැම් ග්‍රහයින් ඔවුන් සිටින ස්ථාන, පාදුවේ ගත් කල විවාහ දෝෂ පිළිබඳව දැන සිටීම ජොතිශවේදීන්ට පමණක් අදාල කටයුත්තක් ලෙස පාඨක ඔබට සිතිය හැක. නමුත් ඒ පිළිබඳව දැනුවත් වී තිබීම කවදා හෝ දිනෙක, ඇතැම් විට දරුවන්ව විවාහකරදෙන විට හෝ ප්‍රයෝජනවත් විය හැක.

මේ පිළිබඳව ලියන විට මගේ ජොතිශවේදී මිතුරෙකුට වූ අත්දැකීමක්ද ඔබ හමුවේ තැබීමට සිත්විය.

දිනක් මවක් හා ලාබාල වයසේ සිටි ඇගේ දියණියත් කේන්ද්‍ර 2ක්ද රැගෙන මිතුරා හමුවට පැමිණියහ. පොරොන්දම් බැල්මටම එම කේන්ද්‍ර නොගැලපෙන බවත්, දෝෂ භංග වීමද නොමැති බවත් මිතුරාට ඒත්තු ගියද ඒ පිලිබඳ එකවරම ඒ පිලිබඳ එකවරම නොපවසා මේ දෙන්නා අතර ප්‍රේම සම්බන්ධයක් තිබේදැයි ඔහු විමසීය.

මිතුරා " "මේ කේන්ද්‍ර දෙකේ අයිතිකාරයෝ යාළු වෙලා වගේද ?" අම්මාටත් කලින් උත්තර දුන්නේ දුවය.

දුව " "ඔව් අයියේ ඔව්"

අම්මා " "උඹ හිටහන් කටවහගෙන. මට ඕනේ මේක ගැලපෙනවද කියලා දැනගන්න. මම තනියෙම එන්න හැදුවෙත් එකයි." අම්මා සැර දැම්මා.

# විවාහ දෝෂ - 02

යෝගී වී ඇති අනෙකුත් ග්‍රහයින් ආදිය අනුව සිය නෛසර්ගික ගුණ පරස්පර ලෙස වෙනස් කරන බව පර්යේෂණ වලින් ඔප්පු වී ඇත.

ශනි 7 විවාහයට හොඳ නැත කියා මතයක් ඇතැමුන් අතර පවතියි. මෙහි පදනම පුරාණ ජොතිශ පොත් පත් වලින් පැවත එයි. අද වන විට එය සාමාන්‍ය මහජනයා අතර තදින් මුල් බැස ඇත. නමුත් විවාහයට නම් ශනි 7 ඉතාමත් හොඳ බව ඔප්පු වී ඇත. දුක් කරදර විඳ, ඒවා ගැන කලකිරීමක් නැතිව සිටීමට ශනි තරම් හොඳ ග්‍රහයෙක් තවත් නැත.

එසේ නම් මෙම මතය ඇතිවුනේ කෙසේද ? පුරාණ පොත් ලියන කාලයේ උගත් පණ්ඩිත බ්‍රාහ්මණයින් බෙහෙවින්ම විවාහ වී තිබෙන්නේ ඔවුන්ට වයස අවුරුදු 48 ගියාට පසු, වයස දොළහේ සිට දහසය දක්වා වූ දැරියන් සමඟය. වයස 48 වන තුරු ඉගෙනීම, ව්‍රත සමාදාන කටයුතු වල යෙදී බ්‍රහ්මචර්යා ශීලය රකිමින් සිට, පරපුර නැති වන වාට අකමැතිව ගිහි සැපට යොමුවුනු මෙම බමුණන්ට තරුණ දූවරු පාවා දීමට පුල පුලා බලා සිට ඇත්තේ සාමාන්‍ය අය නොවේ. මහා ධනවත් සිටුවරු, වැනි අයයි. එයට හේතුව බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව උගත්, ශීලය රකින ලද බමුණන්ට දාව උපදින දරුවන් සෑම අතින්ම දියුණුවන බව කියා තිබීමයි. භාර්යාවන්ගේ සුපරිශුද්ධ භාවය පිණිස වැඩිවිය පැමිණෙන්නට පෙර ළදැරියන්ව ඔවුන්ට පාවා දීමට ඔවුන් පෙළඹුනහ.

ශනි 7 සිටින විට ලැබෙන්නේ තමන්ගේ වයසට සමාන හෝ ඇතැම්විට වයසින් වැඩි සහකරුවන් ය. එබැවින් එලෙස පිහිටි බමුණන්ට මෙම තත්වය පල නොදුන් නිසා එය විවාහයට අශුභ පිහිටීමක් ලෙස මතයක් ගොඩ නැගී ඇත. ශනි 7ට දිග් බල ද වේ. 7 ට ලැබෙන දෘෂ්ටි, ග්‍රහබල හා අනෙකුත් ග්‍රහ යෝග හලා යහ් අශුභ පල දීමක් සිදුවිය හැකි වුවත් ඒ ශනි 7 නිසා නොවේ.

දැන් හරිම වැඩේය. තරුණ දුව අසරණව මිතුරා දෙස බලයි. ඇගේ බැල්මේ "අනේ අයියේ ඕක ගැලපීම හොඳයි කියන්න" වැනි ඉල්ලීමකි.

මිතුරා දෙදෙනාගේ වැඩි විස්තර විමසූවේය. ගෑනු ළමයා ලාබාලය. එතරම් උගත් කමක්ද නැත. පිරිමි ළමයා සංචාරක හෝටලයක සුළු රැකියාවක් කරයි. අම්මා පාරම්පරික මත දරන්නියකි. කෙල්ලට මේ කිසිවක් නොතේ. අනෙක් අතින් මාගේ මිතුරා ශාස්ත්‍රීය ගෞරවය රැකිය යුතුය. තව පසෙකින් මානුෂික ප්‍රශ්නයකි. පැටළුන පඹගාල අනුව කෙල්ලන් කොල්ලන් යාළු වෙන්නේ අපේ කරුමෙට යැයි මිතුරාට සිතිණ.

නැවත වරක් කේන්ද්‍ර 2කේ හරිවැරදි බැලූ මුත් 2ම හරිය. "මේවා පිරිමි ළමයාගේ පැත්තෙන් බලලා නැද්ද"? යාළුවෙලා කොච්චර කල්ද ?

"ඒ ගොල්ලො කේන්දර ගැන ඒතරම් අදහන්නේ නෑ. කේන්දරේ ඉල්ලා ගත්තෙත් බොහොම අමාරුවෙන්. යාළුවෙලා නම් අවුරුද්දක් විතර ඇති."

අවසානයේ ශාස්ත්‍රීය අන්දමින් සලකා හඳහන් ගලපා සුදුසු තත්වයේ නැති බව මිතුරා විසින් මවට පැවසීය. නමුත් මානුෂිකව බලා කැමති දෙයක් කරන ලෙසද කීවද මව එය අසා සිටියා විනා කිසිත් නොපැවසීය. යුවතියගේ මුහුණේ තිබුණේ දුක් මුසු පෙනුමකි.

කාලය ගෙවී ගියේය. දිනක් මව වෙනත් හඳහන් වැඩකට පැමිණි විට මිතුරා හට පැවසුවේ, තමා සම්බන්ධයට තදින් විරුද්ධව සිටියත් හදිසියේ දෙදෙනා හොරෙන් පැන ගොස් විවාහ වූ බවයි. !

■




## හිත තලලා වෙන පිලකට නොයඥ්ඥදයි

පස්සෙන් පහු ඉතුරු ටික කියන්නං කියලා ගිය මාසෙ නැවැත්තුවට පස්සෙ හැමෝටම ඕනෙ වෙලානෙ ඊළඟට මොකද වුණේ කියල දැනගන්න.

මං අයෙමත් කොයින් මාමා ළඟට් කිට්ටු කරලා උන්දෑ ඉස්සරලා මයෙ කං හොරොව්වට දිගේලි කරපු කවිය අහලා විගැහිං කොලේක කුරුටු ගාගෙන වෑ ඉස්මත්තට කිට්ටු කළා.

මම ලහි ලහියේ වෑ ඉස්මත්තට කිට්ටු කරාට මොකෑ මේකිලා කොහේ මකබෑවුණා ද තාමත් නෑ. දෙයියන්ටම ඔප්පු වෙච්චාවෙ. මේකි මගේ ඇඟට කඩා පැනපු පැනිල්ල . තාම මගේ පපුව ගිඩි ගිඩි ගානවා. මං හිතුවෙ වලස් තඩියෙක් කියලා. මේ ඇච්චිට පුදුම දාංගලයක්නෙ තියෙන්නෙ.

මොකෑ අයියණ්ඩි උඹ ඇස් ගෙඩි දෙක උලුප්පාගෙන.. බය ගන්ට කාරි නෑ.. අපි වහන් වෙලා හිටියේ උඹ එනකල්. උඹට කෝනිත්තන් කරන්ට... අක්කණ්ඩි කිව්වා උඹ ඉන්තේරුවෙම්ම එනවා කියලා..

කෝ නගා මලිත්ති..?

ආං බල අර ගල පාමුල තිප්ප තියාන ඔටවං ඉන්නෙ.. උඹට ගඩා ගෙඩි ඔක්කක්ම පුරාන.. කිට්ටු ක රළුතෙන්ට.. මං කෙටේය දලු ටිකක් එක්කොරඥ්ඥදං..

නගා මං අක්කණ්ඩිට ඇහෙන්ට පද පේලියක් දිගේලි කරන්නටද?

දිගේලි කරපන් අයියණ්ඩි ලකට.. අක්කණ්ඩිගෙ කන් හොරොව්වට.. ඕකිටත් හොඳට පුරුදු නොවැ පැදිලි.. බලන්ට එපායැ හේනට නෙළුමට ගියාම.. අයියණ්ඩි විගැහින් දිගේලි කර.. ඒකිත් දිගේලි කරයි උඹට හොඳ හරුපයක්..

*මගෙ විතරක් උඹෙ හැඩ රුව දෑහේ ගෑවෙන්නයි*
*මගේ විතරක් උඹේ පුසුඹ නාහේ ගිල්වන්නයි*
*මගෙ විතරක් උඹෙ උණුහුම දේහේ ගල්වන්නයි*
*මං විතරක් උඹ හැමදා වාහේ කොර ගන්නයි*

කැලේ දෙයියම්පල් අයියණ්ඩි උඹට හොඳට පැදිලි කියන්ට හැකිනෙ.. අන්න බල අක්කණ්ඩිගෙ මූණ වෑ දියෙන් නෙළුමක් උඩ ආවා වගේ.. ඕන් මේ පැත්තට රූටනවා. මලිත්ති කටහඬ අවදි කළේ මිනි ගෙඩියක් හොළවන්නා වගේ.

අයියණ්ඩි දිගේලි කර ගනින් අපූරුවට කන් හො-රොව්වට

*තන තලලා තන බත් ටික උයඥ්ඥදයි*
*අමු තලලා අමු බත් ටික උයඥ්ඥදයි*
*ඔලු තලලා ඔලු බත් ටික උයඥඥදයි*
*හිත තලලා වෙන පිලකට නොයඥ්ඥදයි*

අයියණ්ඩි .. උඹ කොමඩු කන්ඩ මනාපයි කිව්වනෙ.. ඕං පැණි කොමඩු.. සීනි කැකිරි.. පලු.. වීර.. ගල් සියඹලා.. ගිල දාපන් උඹේ රිස්ස යනකල්.. වර නගා යන්ට.. ඔය මදෑ කොකටිය පොදි බැන්දා.. අපි යනෝ අයියණ්ඩි.. අම්මා බලයි මේකිලාට මොකෑ උණේ කියලා..

මං අයෙ වංගියක් එනවා නගා.. උඹෙ මනාපයක් ඇතුවා?

ඇයි උඹට වැඩ නැතුවා..? අපි හැන්දෑ කොරේ දියට එනවා..

හා හොඳා.මං යනවා නගා. නංගිවත් එක්කරාන වර..

අයෙ වංගියක් මලිත්ති හදි ගැහුණාම ඒකි දන්න කවි පොතක ලියා ගන්ට ඕනෑ.

බෝගල